දුරකථන/தொலைபேசி இலக்/Telephone Nos.

| | |
|---|---|
| අමාත්‍යතුමා / அமைச்சர் / Minister | 2784832 |
| ලේකම් / செயலாளர் / Secretary | 2784811 |
| කාර්යාලය / அலுவலகம் / Office | 2785141-50<br>Fax: 2784846 |

ඊමේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்த்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ED/03/53/02/15/II

ඔබේ අංකය / உமது இல. / Your No. ......................................

දිනය / திகதி / Date 2017.09.20

චක්‍රලේඛ අංක: 37/2017

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ
13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනේ නියාමක ව්‍යාපෘතියේ පළමු අදියරට අයත් පාසල්වල විදුහල්පතිවරුන් වෙත.

## 13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන - 2017
## 12, 13 ශ්‍රේණි සඳහා වෘත්තීය විෂය ධාරාව හඳුන්වාදීම

සෑම පාසල් දරුවෙකුටම පළමු ශ්‍රේණියේ සිට දහතුන් වන ශ්‍රේණිය දක්වා අඛණ්ඩ පාසල් අධ්‍යාපනයක් ලබාදීම අරමුණු කර ගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් "13 වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන" හඳුන්වා දෙනු ලැබේ. අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි සියලු සිසුන්ට සමත් අසමත් භාවය නොසලකා ඇතුළත් වීමට අවස්ථාව සලසන, අනාගත අභියෝග ජයගත හැකි වෘත්තීය අධ්‍යාපනයක් ලබාදීම අරමුණු කරගත්, නව වෘත්තීය විෂයයන් 26 ක් ඇතුළත් විෂය ධාරාවක් ඒ යටතේ හඳුන්වා දීමට තීරණය කර ඇත. එහි නියමු වැඩසටහන සඳහා පාසල් 43 ක් (ලැයිස්තුව අමුණා ඇත.) තෝරාගෙන ඇති අතර, එය 2017 ඔක්තෝම්බර් මාසයේ සිට ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත. ඒ අනුව අ.පො.ස. (උ.පෙළ) විෂය ධාරාවන්ට අදාළව නිකුත් කර ඇති අංක 2016/13 චක්‍රලේඛයේ සඳහන් විෂය ධාරාවන් හයට අමතරව 12, 13 ශ්‍රේණි සඳහා මෙම හත්වැනි විෂය ධාරාව හඳුන්වා දෙනු ලබයි.

**02.** මෙම විෂය ධාරාව පහත දැක්වෙන පරිදි ප්‍රධාන සංරචක තුනකින් සමන්විත වේ.

i. පොදු විෂය ක්ෂේත්‍රය
ii. ව්‍යවහාරික විෂය ක්ෂේත්‍රය
iii. ආයතනික වෘත්තීය පුහුණුව

**2.1.** මෙම විෂය ධාරාවට ඇතුළත් වනසිසුන් 12 වන ශ්‍රේණියේ පළමු වාරයේදී (2017 ඔක්තෝම්බර් මාසයේ සිට 2018 මාර්තු මාසය දක්වා) පහත සඳහන් පොදු විෂය ක්ෂේත්‍රය අනිවාර්යයෙන්ම හැදෑරිය යුතුය.

| | පොදු විෂයය ක්ෂේත්‍ර | ඒකක ගණන | පැය ගණන |
|---|---|---|---|
| i. | පළමු බස (සිංහල හෝ දෙමළ) | 10 | 40 |
| ii. | ව්‍යවහාරික ඉංග්‍රීසි සහ සන්නිවේදන කුසලතා | 10 | 60 |
| iii. | සෞන්දර්ය රසාස්වාදය | 04 | 40 |
| iv. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතා | 07 | 60 |
| v. | පුරවැසිභාවයට අදාළ කුසලතා | 08 | 40 |
| vi. | සමාජ යහපැවැත්ම සඳහා අවශ්‍ය සෞඛ්‍ය හා ජීවන කුසලතා | 07 | 40 |
| vii. | ව්‍යවසායකත්ව කුසලතා | 06 | 40 |
| viii. | ක්‍රීඩා හා අනෙකුත් විෂය සමගාමී ක්‍රියාකාරකම් | - | 30 |
| ix. | වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් | - | 60 |

**2.2.** 12 වන ශ්‍රේණියේ දෙවන හා තුන්වන වාර සඳහා පහත සඳහන් ව්‍යවහාරික විෂයයන් අතරින් තුනක් සිසුන් විසින් තෝරාගත යුතුය. එහි හඳුන්වාදීමේ මොඩියුලය (Introductory Module) 12 වන ශ්‍රේණියේ දෙවන වාරයේදී ද (2018 මැයි - ජූලි), අන්තර් මොඩියුලය (Intermediate Module) 12 වන ශ්‍රේණියේ තෙවන වාරයේදී ද (2018 සැප්තැම්බර් - දෙසැම්බර්) ක්‍රියාත්මක කෙරේ. එක් පාසල් වාරයකදී විෂයයකට පැය 100 බැගින් විෂයයන් තුන සඳහා පැය 300 ක් වෙන් කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| i. | ළමා මනෝවිද්‍යාව හා ආරක්ෂණය | xiv. | ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය |
| ii. | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | xiv. | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය |
| iii. | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | xvi. | වැවිලි භෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය |
| iv. | ප්‍රාසාංගික කලාව | xvii. | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය |
| v. | කාර්ය සිද්ධි කළමනාකරණය | xviii. | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය |
| vi. | ශිල්පකලා | xix. | විදුලිය හා ඉලෙක්ට්‍රෝනික තාක්ෂණ අධ්‍යයනය |
| vii. | අභ්‍යන්තර නිර්මාණකරණය | xx. | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය |
| viii. | විලාසිතා නිර්මාණකරණය | xxi. | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය |
| ix. | ග්‍රැෆික් නිර්මාණකරණය | xxii. | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය |
| x. | කලාව හා පිරිසැලසුම්කරණය | xxiii. | මෘදුකාංග සංවර්ධනය |
| xi. | භූ දර්ශන නිර්මාණකරණය | xxiv. | වෙබ් නිර්මාණකරණය |
| xii. | ව්‍යවහාරික විද්‍යා තාක්ෂණ අධ්‍යයනය | xxv. | සංචරණය හා ආගන්තුක සත්කාර |
| xiii. | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය | xxvi. | පාරිසරික අධ්‍යයනය |

**2.3.** 12 වන ශ්‍රේණියේදී තෝරාගත් ව්‍යවහාරික විෂයයන් තුන අතරින් එක් විෂයයක් පමණක් 13 වන ශ්‍රේණියේදි හැදැරිය යුතුය. ඒ ඒ විෂයයන් පාසලේ ඉගැන්විය යුතු පැය ගණන, වෘත්තීය පුහුණුව ලබාදිය යුතු පැය ගණන හා යොමු කළයුතු ආයතන, ඇගයීම් ක්‍රමවේද හා ඒ අනුව පිරිනමනු ලබන සහතිකය පිළිබඳ යථා කාලයේදී සවිස්තරාත්මකව උපදෙස් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

**2.4.** මෙම විෂය ධාරාවේ ඉගෙනුම් සඳහා සාමාන්‍ය ආකාරයට විනාඩි 40 කට සීමා වූ කාලච්ඡේද වෙන්කිරීම අවශ්‍ය නොවන නමුත්, පාසලේ ඇති පහසුකම් හා ගුරුවරුන් යොදා ගනිමින් සම්පූර්ණ විෂය මාලාව හා නිර්ණය කර ඇති කාලසීමාව ආවරණය වන පරිදි නම්‍යශීලී කාලසටහනක් සකසා ගැනීම විදුහල්පතිගේ වගකීම වේ.

## 03. වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක කිරිම සඳහා මූල්‍ය ප්‍රතිපාදන

වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක කරන නියාමක ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා තෝරාගත් ජාතික පාසල් හා පළාත් පාසල් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එක් පාසලකට ප්‍රතිමාන මූලික නිර්ණායක මත එක් වරකට උපරිම වශයෙන් රු. මිලියන 2 ක් බැගින් වන සේ අවශ්‍යතාව මත පාසල් පාදකව මුදල් ප්‍රදානයන් ලබා දෙනු ඇත. එම මුදල් උපයෝජනය පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම්කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ අංක 07/2013 දරණ චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ අත්පොතට අනුව කටයුතු කළ යුතුය. මෙම ප්‍රදානයන් වියදම් කරන කාලසීමාව, අනුමැතිය ලබාගැනීම හා නියාමනය පිළිබඳව අවශ්‍ය උපදෙස් ප්‍රදානයන් නිදහස් කරන අවස්ථාවේ නිකුත් කරනු ඇත.

### 3.1. මූල්‍ය ප්‍රදානයන් යොදා ගතයුතු ක්ෂේත්‍ර

නියාමක ව්‍යාපෘතියේ පළමු අදියරේ පාසල්වල වෘත්තීය විෂය ධාරාව ආරම්භ කිරීම, එය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භෞතික සහ මානව සම්පත් වැඩිදියුණු කිරීම හා සපයා ගැනීම වෙනුවෙන් පහත සඳහන් පරිදි මූල්‍ය ප්‍රදානයන් යොදාගත හැකිය.

i. පන්ති කාමර, විද්‍යාගාර, වැඩ කාමර හා තාක්ෂණ විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම.
ii. අදාළ විෂයයන් සඳහා පාසල් පුස්තකාල පොත් හා ද්‍රව්‍ය මිලදී ගැනීම.
iii. සහය ඉගෙනුම් ද්‍රව්‍යයන්, ප්‍රායෝගික පුහුණුව සඳහා අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගැනීම.
iv. විෂය මාලාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රායෝගික පුහුණු අවස්ථා, උපදේශක සේවා, විෂය බාහිර සහ විෂය සමගාමී ක්‍රියාකරකම් ක්‍රියාත්මක කිරීම.
v. කාර්මික හා වෘත්තීය පුහුණුව සපයාගැනීම සඳහා අවශ්‍ය වන වියදම් (උදා:- ප්‍රවාහන වියදම්)
vi. පරිගණක හා අනෙක් උපකරණ නඩත්තුව, විදුලි බිල්පත් හා අන්තර්ජාල බිල්පත් ගෙවීම.
vii. ශිෂ්‍ය පාදක දීමනාවක් වෘත්තීය පුහුණු කාලසීමාවේදී ශිෂ්‍යයින්ට ලබාදීම.

නියාමක ව්‍යාපෘතියේ ඉදිරි පියවර පිළිබඳ සවිස්තරාත්මක උපදෙස් යථා කාලයේදී ලබාදීමට කටයුතු කරනු ලැබේ.

මෙම වැඩසටහන නියාමක මට්ටමින් ක්‍රියාත්මක වන බැවින් ඉදිරියේදී සුදුසු පරිදි මෙම උපදෙස් සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

1. ලේකම්, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය
2. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
3. සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
5. විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව